## බද්දේගම ප්‍රාදේශීය සභාව

## ගාල්ල දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 10 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 10 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 17 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බද්දේගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,577,900 ක් වූ අවිනිශ්චිත ගිණුම් හර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීමට කටයුතු නොකර, ආදායම් ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

(ආ) ප්‍රවාහන සම්බන්ධතා අවශ්‍යතා හා වෙනත් සේවා වියදම රු.71,087 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.7,108,717 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් රු.7,037,630 කින් වැඩියෙන් දක්වා තිබුණි.

---

(ඈ) 2012 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු දායක මුදල් රු.5,721,722 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.3,854,403 ක් ලෙස දක්වා තිබීමෙන් ණයහිමියන් රු.1,867,319 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ලැබිය යුතු මූලධන ආධාර රු.16,970,360 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ණයගැතියෝ හා මූලධන ආධාර රු.16,970,360 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත සඳහා ගෙවිය යුතු රු.15,408,964 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් රු.15,408,964 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ශේෂය රු.5,298,870 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.2,064,989 ක් ලෙස දක්වා තිබීමෙන් ණය ශේෂය රු.3,233,881 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ගිණුම් විෂයයන් 05 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.5,946,326 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.6,284,337 ක් වීමෙන් රු.338,011 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

#### (අ) පිළිතුරු නොළත් විගණන විමසුම්

2012 දෙසැම්බර් 31 දින වනවිට විගණන විමසුමකට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එකී විමසුමට භාජනය වූ ගනුදෙනුවල ගණනය කළහැකි වටිනාකම රු. රු.151,012 ක් විය.

#### (ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.78,855,434 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.2,192,716 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,709,658 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 2,432 | 587 | 1,135 |
| (ii) | බදු කුලී | 23,259 | 4,261 | 600 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 442 | 1,048 | - |
| (iv) | වෙනත් ආදායම් | 15,929 | 15,704 | 14,737 |

#### 2.2.2 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල සභාවට අයකර ගතයුතු රු.1,089,989 ක් වූ වරිපනම් බදු, රු.46,242 ක් වූ අක්කර බදු සහ රු.600,887 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 5,250 |
| (ii) | මුද්දර ගාස්තු | 8,244,141 |

### 2.2.4 කඩ කාමර බදුදීම.

සභාවට අයත් කඩ කාමර 37 ක් බදුදීම පිළිබඳව සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු අනාවරණය විය.

(අ) වසර 7 කට වඩා පැරණි තක්සේරු මුදලකට අනුව තීරණය කල බදු මුදලක් කඩ කාමර වලින් අය කර තිබුණි.

(ආ) කඩ කාමර 03 ක් අතුරු බදු දී තිබුණි.

(ඇ) බදු කුලී ගෙවීම අඛණ්ඩව මාස දෙකක් පැහැර හරින විට එක්වන් මුදලින් එම කුලී අඩු කරගෙන කඩ කාමරයෙන් ඉවත් කිරීමට සභාවට බලය තිබුණ ද, කඩ කාමර 26 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාවේ පූර්ව අනුමැතියකින් තොරව කඩ කාමර අංක 09 සහ 12 හි වෙනස්කම් කර තිබුණි.

(ඉ) කඩ කාමර 20 ක් ඉදිරියට දීර්සකිරීම් කර, භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා රැස්කර තිබුණි.

(ඊ) ඉරිදා පොල ඉදිරිපිට අලුත් කඩ කාමර අංක 12, 13, 14, 16, 17, 18, 19 සහ 20 වසා තිබුණි.

### 2.2.5 විදුලි සංදේශ කුළුණු ගාස්තු

---

කන්දෙවත්ත තලාව ග්‍රාමයේ ඉදිකර ඇති ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් කුළුණ සඳහා රු.25,000 ක් පෙරසැරි ගාස්තු ලෙස හා රු.3,000 ක් අනුකූලතා ගාස්තු ලෙස අය කළයුතු වුවද, පෙරසැරි ගාස්තු ලෙස රු.13,800 ක් පමණක් අයකර තිබුණි.

**2.3 අවිධිමත් ගනුදෙනු**

---

2006 අප්‍රේල් 10 දිනැති අංක:28 දරන කළමනාකාර සේවා චක්‍රලේඛය අනුව ස්ථිර/තාවකාලික/ අනියම්/ආදේශක/කොන්ත්‍රාත් හෝ වෙනත් කිසියම් පදනමක් මත බඳවා ගැනීම් කරනු ලබන්නේ නම් ඒ සඳහා කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබා ගතයුතු වුවද, එසේ අනුමැතිය ලබා නොගෙන සභාව විසින් අනියම් හා ආදේශක පදනම මත සේවකයන් 33 දෙනෙකු බඳවාගෙන සේවයේ යොදවා 2012 වර්ෂය තුළදී වැටුප් හා දීමනා වශයෙන් රු.6,242,907 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

**2.4 ඉඩම් වෙන්දේසි**

---

**(අ) බරසැදෙනියදූව ඉඩම**

---

මෙම ඉඩම් වෙන්දේසිය පිළිබඳව 2013 අගෝස්තු 13 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ඉඩම් වෙන්දේසියෙන් සභාවට වෙන්කර ඇති වපසරිය පර්චස් 39.75 ක් වූ කැබලි අංක 56, 57 සහ 58 ට අදාළ හිමිකම්/තෑගි ඔප්පු ලබාගෙන නොතිබුණි. එමෙන්ම මෙම ඉඩම කැබලි 03 කුඹුරකට මායිම් වූ බෑවුම් සහිත ඕවිටක පිහිටි ඉඩම් තීරුවක් බව ද නිරීක්ෂණය විය.

(ii) 2008 දෙසැම්බර් 16 දින නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ 7(iii) අනුව ඉඩම් අනු බෙදුම් සඳහා අනුකූලතා සහතිකයක් ලබා ගත යුතුය යන්න දක්වා තිබුණ ද, විගණිත දිනය වූ 2013 අගෝස්තු 13 දින දක්වා අනුකූලතා සහතිකයක් ලබාගෙන නොතිබුණි. නමුත් මෙම ඉඩම් කැබලි විකුණා තිබූ බව ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. ඒ අනුව පළමු කැබැල්ලට රු.1,000 ක් ද, ඉතිරි කැබලි සඳහා රු.500 බැගින් ද, වන ලෙස අනු බෙදුම් කරන ලද කැබලි 50 සඳහා අනුකූලතා සහතිකය නිකුත් කිරීමෙන් අය වියයුතු රු.25,500 ක් සභාවට අහිමි වී තිබුණි.

**(ආ) ග්‍රීන්ෆීල්ඩ් ඉඩම**

(i) මෙම ඉඩම අනුමත කිරීමේ දී සියළුම මාර්ග සහ ඊට අයත් දේපල සභාව සතු වන බැවින් ඒ සඳහාත් කැබලි අංක 43 හා 44 යන කැබලි දෙක පොදු කටයුතු වෙනුවෙන් වෙන් කිරීම සඳහාත් ඔප්පුවලින් සභාවට පවරා දිය යුතු බවට කොන්දේසි පනවා තිබුණ ද, රූඩ් 01 පර්චස් 4.44 ක් වූ මාර්ග සඳහා වෙන්කර තිබූ කැබලි අංක 65 ට අදාළ ඔප්පුව සහ පොදු කටයුතු සඳහා වෙන් කරන ලද කැබලි අංක 43 හා 44 ට අදාළ ඔප්පු සභාව වෙත ලබාගෙන නොතිබුණි.

(ii) පොදු කටයුතු සඳහා සභාවට ලබා දී තිබූ පර්චස් 23.77 ක් වූ කැබලි අංක 43 සහ 44 අක්කර 5 ක ඉඩමේ ගිණිකොනදිග කෙලවර පවතින ඉඩම් කැබලි බැවින් පොදු කටයුතු සඳහා යොදා ගතහැකි ආකාරයේ සුදුසු ඉඩම් කැබැල්ලක් නොවන බවත් බටදොඹගහ ඕවිටට මායිම්ව පිහිටි ඉඩමේ පහත්ම බිම් කොටසක් බවත් 2013 අගෝස්තු 13 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

**(ඇ) කන්දෙවත්ත ඉඩම**

මුලටියන්ගොඩ වත්ත ඉඩම හා කප්පියන්ගොඩවත්ත ඉඩම් කැබලි සැලැස්ම සැලසුම් කමිටුව විසින් අනුමත කිරිමේදී විදුලිය සහ ජලය සෑම කැබැල්ලකටම ලබා ගැනීමට හැකි වන පරිදි සැකසිය යුතු බවට, යටත්ව (දින රහිතව) අනුමත කර තිබුණි.

කැබලි විකිණීමට ප්‍රථම ජලය, විදුලිය හා මාර්ග වැනි සියලු යටිතල පහසුකම් සංවර්ධනය කොට අනුකූලතා සහතිකය ලබාගත යුතුය යන්න දක්වා තිබුණ ද, විදුලිය හා ජලය ලබා දී නොතිබූ අතර කැලි කසල ඉවත් කිරීමට ක්‍රමවේදයක් ද සකස් කර නොතිබුණු බව 2013 ජුලි 10 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

## 2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂ 04 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පැවතුණ රු.27,256 ක් වූ අගරු චෙක්පත් 07 ක් සඳහා අදාල පාර්ශවයන්ගෙන් මුදල් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ආ) වසර 05 කට වඩා වැඩි කාලයන සිට ඉදිරියට ගෙන එමින් පැවති රු.516,947 ක ගිණුම් ශේෂ 06 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවකයින් 03 දෙනෙකුගෙන් වර්ෂ 03 ක සිට අයවීම් හිඟහිටව තිබූ ණය ශේෂය රු.29,865 ක් විය. මෙම හිඟහිටි ණය ශේෂයන් අයකර ගැනීමට සභාව විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(ඈ) 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ ලිපිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඉ) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඊ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවද, සභාවේ සභාපති, උප සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් සියලු දෙනා විසින් 2012 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

------------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර 2006 අගෝස්තු 28 දිනැති හා අංක : PE/F/S/4(xiii) දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) මූල්‍ය පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය